# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14.727/6 — 1966 දෙසැම්බර් 27 වැනි අඟහරුවාද — 1966.12.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම

අංක කේග්‍යු/62/66 දරණ ආහාර මිල නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය
(එකතු කළ යුතු නිත්‍ය මිළ)

### මිල පාලන පනත

### ආඥව

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් ෆ්‍රෙඩරික් ඩයස් වීරතුංග වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වෙනි ඡෙදය හා 3(2) වෙනි ඡෙදයන්ගෙන්ද මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1966 දෙසැම්බර් මස 5 වෙනි දින හා අංක 14724/5 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අංක කේග්‍යු/61/66 හා 1966 දෙසැම්බර් මස 1 වන දින දරණ ආහාර මිළ ආඥව මෙ දින් සිට අවලංගු කරමි.

(2) මෙහි වූ උපලේඛනයේ 3 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සහා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම තොග මිළ ලෙස එවකට නියම කර ඇති මිළ ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නොවිකිණිය යුතු උපරිම තොග මිළ විය යුතු ලෙස වහාම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

(3) මෙහි වූ උපලේඛනයේ 4 වෙනි තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සහා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිළ ලෙස එවකට නියම කර ඇති මිළ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උප ලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නොවිකිණිය යුතු උපරිම සිල්ලර මිළ විය යුතු ලෙස වහාම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

(4) මෙම ආඥවේ කාර්යය සඳහා—

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්ය සඳහා වූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්,

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළ බර හොණ්ඩරයකට අඩුයම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් නියම කරමි.

(5) මෙම ආඥවෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිම තැනැත්තෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) මෙම ආඥවෙන් උපරිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍ය සඳහා මෙම ආඥවෙන් නියමිත උපරිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ සුචකයක හෝ මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය සහ ඒ සඳහා නියම කරන ලද උපරිම මිළ යම් ගණුදෙනුකරුවෙකුට පැහැදිලිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළ යුතු බව නියම කරමි.

(7) මෙම ආඥවේ කාර්යය සඳහා "රාත්තල" හෝ "රා" යන්නෙන් ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැලකිය යුතු බව නියම කරමි.

(8) මෙම ආඥවෙන් උපරිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම ගැනුම්කරු ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් —

(අ) විකුණූ දිනය;
(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුව);
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන්ද, නැතහොත් සිල්ලර වශයෙන්ද යන බව ඇතුළත් කුවිතාන්සියක් ගැනුම් කරුට දිය යුතු බව නියමු කරමි,

(9) මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට ඒ විකුණනු ලැබූ ද්‍රව්‍ය යම් ගෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම්, එහි මිළත් ඒ උපලේඛනයේ 3 වන සහ 4 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතු බව නියම කරමි.

1966 දෙසැම්බර් මස 24 දින පෙ.ව. 11 ට කුරුණෑගල කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇෆ්. ඩී. වීරතුංග,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

## උපලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය | 4 වන තීරය |
|---|---|---|---|
| ද්‍රව්‍යය | ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය<br>රු. ශ. | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය<br>රු. ශ. |
| ළූනු (රතුළූනු සහ චික්බෙලාපූර් හැර වෙනත් සියළුම) | කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයට අයත් සියළු පෙදෙස් | 1 65 | 0 2 |
| කොත්තමල්ලි | එම | 2 65 | 0 2 |
| මුංඇට | එම | 2 65 | 0 2 |
| කෝර පරිප්පු | එම | 2 65 | 0 2 |
| කඩල පරිප්පු | එම | 2 65 | 0 2 |
| සියඹලා | එම | 2 65 | 0 2 |
| අර්තාපල් | එම | 1 65 | 0 2 |
| රතුළූනු | එම | 1 65 | 0 2 |

සැලකිය යුතුයි.—මේ මිළ ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියම කර ඇති මිළ නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ වන අතර ඊට ඉහලින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

(2) මේ රටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

12–1474

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රපිතයි